රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්**

**SLS 21563/21663 - විශ්ව නාට්‍ය පරිචය**

ප්‍රශ්න හයකට (06) පමණක් පිළිතුරු සපයන්න.
පැහැදිලි අත් අකුරින් ලියන්න.

කාලය : පැය 03

1. සංස්කෘත නාට්‍යයේ වස්තු විෂයයෙහි විශේෂත්වය එහි ප්‍රභේද අනුසාරයෙන් සනිදර්ශනව පැහැදිලි කරන්න.

2. මැටි කරත්තය නාට්‍යයේ චරිත නිරූපණයෙන් දුගීබව හා ආදරය පිළිබඳ කවර සංකල්ප නිරූපණය වේ දැ යි විමසන්න.

3. "ඊඩිපස් නාට්‍යයෙන් ප්‍රකට වන්නේ සොෆොක්ලීස්ගේ නාට්‍යකරණය පිළිබඳ මනා පටුත්වයයි." මේ අදහස සනාථ කරන්න.

4. "ජපානයෙහි වසර 300 ක් පමණ පැරණි වූ නාට්‍ය සම්ප්‍රදායයන් පවතී." විමර්ශනාත්මක විග්‍රහයක යෙදෙන්න.

5. නාට්‍යයක උත්ප්‍රාස රසය ගොඩනැගෙනුයේ කෙසේ දැ යි හැම්ලට් නාට්‍යයෙහි එන 'පොලෝනියස්' හා 'ක්ලෝඩියස්' චරිතද්වය ඔස්සේ විවරණය කරන්න.

6. එලිසබතන් යුගයෙහි නාට්‍ය කලාවේ පැවති සුවිශේෂතා පිළිබඳ විවරණයක් කරන්න.

7. "සාමාන්‍ය මිනිසුන්ගේ දෛනික ජීවිතය පිළිබඳ සමාජීය සහ දේශපාලනික දැක්මකින් යුතු විවේචනයක් වේදිකා ප්‍රාප්ත කිරීම විසිවන සියවසේ විශ්ව නාට්‍ය කලාවේ එක් සුවිශේෂී ප්‍රවණතාවක් විය." සනිදර්ශනව සාධනය කරන්න.

8. 19 වන සියවසේ යුරෝපය සහ ඇමරිකාව කේන්ද්‍ර කර ගනිමින් ඇති වූ තාක්ෂණික දියුණුව වේදිකා නාට්‍ය කලාවට එල්ල කළේ කවරාකාර බලපෑමක් දැ යි විග්‍රහ කරන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි)

@@@@@@@@@@@@@@@@@@@@